## '' සබ්බ දානං ධම්ම දානං ජිනාති ''

**සියලු දාන වලට වඩා ධර්ම දානය උතුම්වේ.**

සක්වල ගැබ සිට භවාග්‍රය දක්වා අතරක් නැතිව බුදු පසේ බුදු මහ රහතන් වහන්සේලා වඩා හිඳුවා දෙන ලද ප්‍රණීත පිණ්ඩපාත දානයට ද වඩා ධර්ම දානමය පිංකම ශ්‍රේෂ්ඨ වේ. එසේම මහා විහාරයන් ට සමාන විහාර ද, එසේම ලෝවා මහා පාය වැනි ප්‍රාසාදයන් සිය දහස් ගණන් කරවා දෙන ලද සේනාසන දානයට ද වඩා ධර්ම දානමය පින උතුම්වේ.

එයට හේතුව නම් ඉහත සිවුරු පිදීම , පිණ්ඩපාත දාන , සෙනසුන් ඉදිකර පිදීම ආදී පුණ්‍ය කර්ම කරනුයේ ධර්මය අසා දැනගත් බැවිනි. ධර්මය දැන ගන්නට නොලැබුණි නම් බත් හැන්දක්වත් නොදෙන බව ධර්මයේ පෙන්වා දී ඇත. ඒ කරුණින් ද ධර්ම දානමය පිංකම සියලු දාන පරදවන බව දත යුතුය.

මේ හේතුවෙන් ධර්ම දානමය පිනම සියලු දානමය පිංකම් වලට වඩා ශ්‍රේෂ්ඨ වන බව , අග්‍ර වන බව තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ දේශනා කල සේක. එබැවින් සත් පුරුෂයෙනි, මෙම උතුම් පොත කියවා බලා ඔබ වඩ වඩාත් ධර්ම ප්‍රචාරක වැඩ කටයුතු වල නිරත වෙත්වා. බණ කීම, ධර්ම ග්‍රන්ථ, පත්‍රිකා මුද්‍රණය කොට බෙදා දීම් ආදී පිංකම් වල නුවණින් යෙදෙත්වා.

මෙම ධර්ම දානමය පින්කම තමන් වහන්සේ පමණක් නොව ලෝක සත්වයාද මේ සසරින් එතෙර කිරීමට අප බුදු පියාණන්වහන්සේ ගිය මග යමින් අපද මෙලෙසින් ධර්ම මාර්ගයෙහි තබන අපගේ ගරුතර අරිය ධම්ම ස්වාමීන් වහන්ස, ඔබවහන්සේගේ බුද්ධත්වය පිණිසම හේතු වාසනා වේවා.

එසේම ''ධර්මදාන සංසදය'' හා එක්ව ධර්මදාන කටයුතු වල නියැලෙන මැල්සිරිපුර නා උයන ආරණ්‍ය සේනාසනයේ මහා සංඝරත්නය ඉතා සමීපව ඇසුරු කරන අප කල්‍යාණ මිතුරු පිරිසටද මේ පින නිවන් සුව පිණිස හේතු වේවා.

එසේම අඩු වියදමකින් මුද්‍රණ කටයුතු කර දුන් දිමුතු මුද්‍රණාලයේ සියළු දෙනාටමත් මේ උතුම් ධර්ම දානමය පින නිවන් සුවය සඳහා හේතු වේවා. !

**සංවිධානය**
**''ධර්මදාන සංසදය''**
**දුරකතන: 071-4441545, 077-8829705, 071-5186770**

නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
වණ්ණෝ හේසෝ සාරිපුත්ත
යෝ ඒවං තථාගතස්ස
ඒවං වදෙය්‍ය
යස්සච බවාස්ස ධම්මෝ දේසිතෝ
සෝ නීයාති සම්මා දුක්ඛස්ස අන්තකිරියායාති

ශ්‍රද්ධාවන්ත පින්වතුනි !

තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අරිහත් වූ සම්‍යක් සම්බුද්ධ දසබලධාරී සර්වඥ රාජෝත්තමයාණන් වහන්සේ විසින් සිංහනාදත්ස්වරයෙන් දේශනාකොට වදාළ විශේෂ දේශනයක කෙටි මාතෘකාවක් මේ ප්‍රකාශ වුණේ. අද මේ අප සෑම දෙනාටම මේ උදාපත් වී තිබෙන්නේ දුරුතු පුර පසළොස්වක පොහොය දවසයි. ශාන්තිනායක සම්මා සම්බුදුරජාණන් වහන්සේ බෝධි මූලයේදී ලොව්තුරා බුදුවෙන දවසේදීම අනාගතස්ස ඥානයෙන් දැක වදාලා අවුරුදු 5000 ක් මුළුල්ලේ සම්බුද්ධ ශාසනය මුල් බැසගෙන පවතින්නේ ශ්‍රී ලංකාද්වීප ධරණී තලයේ කියලා. ඒ නිසා ලංකාද්වීපය පිරිසිදු බවට සුවිසුද්ධ බවට පැමිණිය යුතු බැවින් තථාගතයන් වහන්සේ බුදුවීමෙන් 8 වෙනි මාසයේදී දුරුතු පුර පසළොස්වක පොහොය දවසේදී, ශ්‍රී ලංකාවට වැඩම කරවලා ලංකාවේ නා නා දිසාභාගවලින් රැස්වූ යක්ෂ සමාගමෙහි ඔවුන්ට අභය දෙමින් ශ්‍රී ලංකාවෙන් ඉවත් කරවා, ඒ අයට සුදුසුම වාසනාවන්ත දූපතකට යවා දෙවියන්ට දහම් දෙසා සුමන සමන් දෙවියන් ඇතුළු 84000ක් පමණ දෙවියන් මගවිල නිවනේ පිහිටුවා ජීව කේශධාතු මිටක් භාරදී මහියංගන චෛත්‍යය රාජයාණන් වහන්සේ ඉදිවීමට අවස්ථාව සලසලා ශ්‍රී ලංකාව වටේ අහසේ තෙවරක් බුදුරැස් විහිදුවමින් ශ්‍රී ලංකාවට ආශිර්වාද පිණිස චාරිකාවේ වැඩම කළ දවස අද මේ දවසයි.

ඒ නිසා අප සියළු දෙනා අද දවසේ ජීවමාන බුදුරජාණන් වහන්සේ විසින් අප වෙත දැක්වූ මහා කරුණාව අනුස්මරණය කරමින් ඒ සර්වඥයන් වහන්සේගේ ගුණස්කන්ධය සිතෙහි දරාගෙන අපටත් ඒ

ශාන්ති නායකයන් වහන්සේ ගමන් ගත් ශාන්ත නිවන් මග ගමන් කර ගැනීමට වාසනාව උදාවේවා කියන අධිෂ්ඨානයෙන් යුතුව මේ ධර්ම දේශනයට සවන් දෙමු.

මාතෘකා කළ ධර්ම දේශනාව මජ්ඣිම නිකායේ මූල පණ්ණාසකයෙහි දෙවනුව තියෙන සිංහනාද වර්ගයෙහි දෙවෙනි සූත්‍රයයි. මෙය හඳුන්වනව "මහා සීහනාද සූත්‍රය" කියල. තව දුරටත් මේක හඳුන්වනව "ලෝමහංස පරියාය සූත්‍රය" කියල. එතරම්ම ලොමු ඩැහැගැන්වූ අවස්ථාවක් මේ දේශනාව පැවැත්වූ වෙලාවේ සිදුවෙච්ච බව නාගසමාල රහතන් වහන්සේ ප්‍රකාශ කරල තිබුණා.

මේ දේශනයට හේතුව වූයේ දිනක් සාරිපුත්‍ර මහරහතන් වහන්සේ විශාලා මහනුවර පිඩු සිඟා වඩිද්දී අහන්ට ලැබුණ සුනක්ඛත්ත ලිච්ඡවි පුත්‍රයා ගිහිවෙලා බුදුරජාණන් වහන්සේට දෝශාරෝපණය කරන පණිවිඩයක්.

ඒ සුනක්ඛත්ත ලිච්ඡවි පුත්‍රයා කියන්නෙ බුදු සසුනෙහි පැවිදි වී සිටිය විසාලා මහනුවර ලිච්ඡවි රාජකුමාරයෙක්. එසේ නමුත් ඒ තැනැත්තාට අරිහත් මාර්ගඵල ලබන්ට අවස්ථාව ලැබුණේ නෑ. ඒ තැනැත්තාට පුළුවන් වුණා අශ්ඨ සමාපත්ති ලාභීව දිබ්බ චක්ඛු ඥානය පමණක් උපදවන්ට. ඔහුට දිබ්බ සෝත ඥානය ලැබීම සඳහා උපදෙස් ඉල්ලු වෙලාවෙ සර්වඥයන් වහන්සේ ඒක දුන්නෙ නෑ, ඔහුට ලැබෙන්නෙ නැති නිසා. ඔහු පෙර ජාතියක අතකුරුස ශිල්පය නිසා පසේ බුදු කෙනෙකුන් වහන්සේ ඝාතනය කළ අකුසලයක් තිබුණ කනට ගලක් විදල. ඒ අකුසලය නිසා ඔහුට ඒ ජීවිතයේදි දිව කන් නුවණ ලබන්නට වාසානාව නෑ. ඒක නුදුන් නිසා ඔහු බුදුරජාණන් වහන්සේ එක්ක වෛර බැඳගත්තා. බුදුරජාණන් වහන්සේට උපස්ථාන කරමින් සිටිද්දීම කෝරක්ඛත්තිය කියන තීර්ථකයාට වන්දනා කලා. ඒ අවස්ථාවේ සර්වඥයන් වහන්සේ කෝරක්ඛත්තිය ගැන අනාගත වාක්‍ය ප්‍රකාශ කළා. ඒ සියල්ලම එසේ සිදුවුණා. නමුත් ඒ සුනක්ඛත්ත ලිච්ඡවි පුත්‍රය ගිහිවෙල විසාලා මහනුවර තැන් තැන්වල තථාගතයන් වහන්සේ ගේ දොස් ප්‍රකාශ කරමින් ඇවිද්ද. ඒ දෝශය නමින් සඳහන් කරල



තියෙන්නෙ තථාගතයන් වහන්සේට උත්තරීතර මනුෂ්‍ය ධර්ම නෑ, උන්වහන්සේ තර්ක විතරක් කරමින් තමන්ට වැටහෙන හැටියෙන් බණ කියනව. එසේ නමුත් ඒ ධර්මය අසන්නන්ට මාර්ගඵල නිවන ගෙන දෙනව කියන එකයි මේ දෝශාරෝපණය.

එම කථාව සැරියුත් මහරහතන් වහන්සේ බුදුරජාණන් වහන්සේට ඉදිරිපත් කළා. එදා බුදුරජාණන් වහන්සේ වැඩ සිටියේ විසාලා මහනුවර නගරයට බස්නාහිරින් තියෙන "අපුරපුර වනසන්ඩ" කියන ආරණ්‍ය සේනාසනයෙහිය.

බුදුරජාණන් වහන්සේ වදාළා සාරිපුත්‍රය ! මේ සුනක්ඛත්ත ලිච්ඡවි පුත්‍රයා තථාගතයන් වහන්සෙගේ පාත්‍රා සිවුරු අරගෙන බුදුරජාණන් වහන්සේ පසුපසින් උපස්ථාන කරමින් ගියත් ඔහුට දැන ගන්න බැරිවුණා තථාගතයන් වහන්සෙගේ ගුණස්කන්ධය. ඔහු උන්වහන්සේගේ අගුණයක් කියමින් ගුණයක්මයි ප්‍රකාශ කරලා තියෙන්නෙ. සාරිපුත්‍රය! යම් කෙනෙක් කියනවනම් මේ තථාගතයන් වහන්සේ දෙසූ ධර්මය අසන්නවුන්ට මගඵල නිවන් සුව ගෙන දෙනව කියල ඒක තථාගතයන් වහන්සෙගේ ගුණ වර්ණනාවක් ගුණ කථනයක් කියන එකයි සූත්‍ර පාඨයේ කෙටි තේරුම.

"වණ්ණෝ හේසෝ සාරිපුත්ත තථාගතස්ස"
සාරිපුත්‍රය මේක තථාගතයන් වහන්සේගේ ගුණ කථනයක්මයි.

"යෝ ඒ වං වදෙය්‍ය"
යමෙක් මෙහෙම කියනව

"යස්සව ඕවා ධම්මෝ දේසිතෝ සෝ නීයාති සම්මා සුක්ඛස්ස අන්තකිරියාය"
යම් කෙනෙක් උදෙසා තථාගතයන් වහන්සේ ධර්මය දේශනා කරනවනම් ඒ තැනැත්තා දුක් කෙළවර කරලා සසර මගඵල නිවන ලබනවා.

මෙම කියන කථාව ගුණ කථනයක් නමුත්, සාරිපුත්‍රය !

සුනක්ඛත්ත ලිච්ඡවි පුත්‍රයා මේ කතාව කියන්නෙ ක්‍රෝධයෙන් මුසපත් වෙලා, අන්ධවෙලා, මේ කථාව කරන කෙනා කොයිවිදිහෙද කියනවනම් හිසේ තිබුණ බරක් බහා තබන්නේ යම්සේද ඒ වගේම මේ තැනැත්තා මේ සිත අත් නොහැර, මේ වචනය අත්නොහැර, මේ දෘෂ්ඨිය අත් නොහැර හිටියොත් ඒකාන්තයෙන්ම අවීචි මහා නරකයටම යනව කියල පළමුවෙන්ම ප්‍රකාශ කරල දේශනා කලා.

සාරිපුත්‍රය! තථාගතයන් වහන්සේගේ ගුණස්කන්ධය මේ විදිහට ඔහු දැනගෙන ඉඳල නෑ.

තථාගතයන් වහන්සේ සකල ක්ලේශයන් කෙරෙන් දුරුවූ හෙයින් අරහත් නම් වෙනව.

සර්ව ධර්මයන් සර්ව ආකාරයෙන් අවබෝධ කළ බැවින් සම්මා සම්බුද්ධ නම් වෙනව.

ත්‍රිවිද්‍යා අෂ්ඨ විද්‍යා පසළොස්චරණ ධර්මයන්ගෙන් සමන්නාගත බැවින් විජ්ජාචරණ සම්පන්න නම් වෙනව.

සෝභන ගමනින් ගමන් ගත් බැවින් ශාන්ත නිවනට සැපත් වූ බැවින් මගඵල නිවන දක්වා අන්තඅචයවර්ජිත මධ්‍යම ප්‍රතිපදාවෙන් ගමන් ගත් බැවින් සාර්ථක දේශනා ඇති බැවින් සුගත නම් වෙනව.

ස්කන්ධ ලෝක ආදි වශයෙන් තියෙන සර්ව ලෝකයන් අවබෝධ කළ බැවින් ලෝකවිදු නම් වෙනව.

ශීල සමාධි ප්‍රඥා ගුණ විශේෂයන්ගෙන් උත්තරීතර බැවින් හා දමනය කළ යුතු සත්වයන් විශිෂ්ඨ ලෙස දමනය කළ බැවින් අනුත්තරෝ පුරිසදම්ම සාරතී නම් වෙනව.

දෙවි මිනිසුන් සහිත සමස්ත ලෝකයාට මෙලොව සුභසෙත පරලොව සුගතිය ශාන්ත නිවන පිණිස අනුශාසනා කරන බැවින් සත්වයන් සංසාර කාන්තාරයෙන් එතෙර කරවා



නිර්වාන ක්ෂේම භූමියට පමුණුවන බැවින් සත්ථා දේව මනුස්සානං ගුණයෙන් සමන්නාගත වෙනව.

තමන් වහන්සේ අවබෝධකරගත් ගාම්භීර චතුරාර්ය සත්‍ය ධර්මය ලෝවැසි ජනතාවට නා නා ක්‍රමයෙන් අවබෝධ කරවූ බැවින් බුද්ධ නම් වෙනව.

සදේවක ලෝකයාගේ පාරමී පුණ්‍ය භාග්‍යයට වඩා සත සහස්‍රතර ගුණයෙන් අධිගතර වූ පාරමී පුණ්‍ය භාග්‍යයෙන් සමන්විත වන බැවින් ක්ලේශ මාරාදී පංච මාරයන් බිඳලූ බැවින් ඓශ්වර්යාදී භාග්‍ය ධර්මයන්ගෙන් සමන්විත බැවින් සර්ව ධර්මයන් විවිධාකාරයෙන් බෙද බෙදා දහම් දෙසූ බැවින් ලෝක ධාතුවෙන් එතෙර වූ ශාන්ත නිවන සාක්ෂාත් කළ බැවින් භව ගමන අවසන් කල බැවින් උත්තරී මනුෂ්‍ය ධර්ම ප්‍රතිලාභ කළ බැවින් භගවා නම් වෙනවා,

කියන මේ ගුණස්කන්ධයන් සුනක්ඛත්ත ලිච්ඡවි පුත්‍රයා දන්නෙ නැති නිසයි මෙහෙම ප්‍රකාශ කරන්නෙ.

මේ වචනය අත්නොහැර මේ සිත අත්නොහැර මේ දෘෂ්ටිය අත් නොහැර සිටියොත් ඔහු හිසේ තිබූ බරක් බහා තබන්නාක් මෙන් අන්තිමේදී තමන් අවීචිමහා නරකාදියට යනව, කොයි වගේද කියනව නම් අරිහත් මාර්ග ඥාන සම්ප්‍රයුක්ත සමාධියෙන් ප්‍රඥාවෙන් යුක්ත වූ භික්ෂූන් වහන්සේ නමක් අරිහත් මාර්ගයට අනතුරුව අරිහත් ඵලයට පත්වන්නේ යම්සේද ඒ වගේම මේ තැනැත්තා අවීචියේ උපදිනව කියල පහදා දුන්න.

ඒ වගේම සාරිපුත්‍රය තථාගතයන් වහන්සේ මනුෂ්‍ය ඇස ඉක්මවා ගිය දිවැස් නුවණින් මේ ලෝකයෙහි සියලු දේ දකිනව. මැරෙන උපදින සත්වයන් දකිනව. ඒ වාගේම සුගති දුගති යන සත්වයන් දකිනව, සෝභන අසෝභන සත්වයන් දකිනව, ඒ වගේම හිත නැති හිත ඇති සෑම ධර්මයක්ම තථාගතයන් වහන්සෙගේ දිබ්බ චක්ඛු ඥානයෙන් දකිනව. ඒවාගේම තථාගතයන් වහන්සේ සෑද විධ

ඥානයෙන් සමන්නාගත වෙනව. නා නා විධ සෘද විශේෂයන් කිසිවකුට සමාන කරන්න බැරි සෘද විශේෂයන් තථාගතයන් වහන්සේ පවත්වනවා.

ඒ වගෙම තථාගතයන් වහන්සේ දිව්කන් ඇති නුවණින් ඉතා ළඟ වුද ඉතා දුර වුද මනුෂ්‍ය වුද අමනුෂ්‍ය වුද සියලුම සත්වයන් අහන්න සමර්ථ වෙනව. සාරිපුත්‍රය! මේ තරම් විද්‍යාවන්ගෙන් සමන්නාගත තථාගතයන් වහන්සේගේ ගුණස්කන්ධය දැන දැනත් මේ තැනැත්තා මේ කරන දෝෂාරෝපණය අත් නොහැර හිටියොත් හරියට අරිහත් මාර්ග සම්ප්‍රයුක්ත සීල සමාධි ප්‍රඥාවෙන් යුතු ආර්යයන් වහන්සේ ඊලඟටම අරිහත් ඵලයට පත්වන්නේ යම්සේද ඒ වගේම හිසේ තිබූ බරක් බිම තබන්නා සේ අවීචි මහා නරකාදියේ උපදිනව.

ඒ වගේම සාරිපුත්‍රය! තථාගතයන් වහන්සේට තියෙනව කාය බල දහයක් සහ ඥාන බල දහයක්. කාය බල දහයක් කියන්නෙ නිකං කාය බල දහයක් නෙවෙයි, ඡද්දන්ත ඇතුන් දහයකට සමාන කාය බල තියෙනව.

ඇතුන්ගේ කුල පරම්පරා දහයක් තියෙනව. එම කුල පරම්පරාවෙන් ඉතාම අඩු ශක්තිය ඇති "කලාවක" ඇතා තමයි බොහෝ සෙයින් මනුෂ්‍ය පථයේ හැසිරෙන්නෙ.මේ "කලාවක" කියන ඇතාට තියෙනව මධ්‍යම පුරුෂයන් දහයකට තියෙන කාය බලයක්.

ඔය විදියට කලාවක, ගංගෙය්‍ය, තම්බ, පණ්ඩල, පිංගල, ගන්ධ, හේම, උපෝසථ, ඡද්දන්ත කියල ඇතුන් කුල දහයක් තියෙනවා.

එක එක ඇතුන් කුලයක දහ ගුණයෙන් දහගුණය ඉහළට ඉතිරි ඇතුන් කුලයන්ගේ ශක්තිය පවතිනව. එම සියලු ඇතුන්ට වඩා ඡද්දන්ත ඇතාගේ ශක්තිය පුදුමයි. මනුෂ්‍යයන් කෝටි දාහකට සමාන ශක්තිය පවතිනව ඡද්දන්ත ඇතාට. ඔහු අසූ රියනක් උසයි කියනව. ඒ වගේම ඔහුට අහසින් ගමන් කරන්න පුළුවන්. මේ විදියට ඡද්දන්ත



ඇතුන් දහදෙනෙකුට සමාන කාය බලයක් තථාගතයන් වහන්සේට තියෙනව. ඒකට කියනව "නාරායන මහා බලය" කියල. මේ මහ පොළව විලුඹෙන් තද කළොත් කම්පා වෙනව. ඒ තරම් පුදුම කාය බලයක් තථාගතයන් වහන්සේට පවතිනව.

බෝසතාණන් වහන්සේ වයස දහසයේදී නෑදෑයන් මැද්දේ ශිල්ප දක්වන වේලාවේදී තමන් වහන්සේගේ වම්පයේ මාපට ඇඟිලි කරුවට දුණු දන්ඩ තියල හීය ගස්සන කොට පොළව කම්පා වුණා කියනව. මේ තරම් කාය බලයක් ලැබුණෙ නිකන් නෙවෙයි අසංඛෙය්‍ය ජීවිත කාලයක් පමණක් නොවෙයි, අසංඛෙය්‍ය අප්‍රමෙය්‍ය පරිච්ජේදයක් තුල සිල්වත් ගුණවත් මහා සඟරුවනට බුදු, පසේබුදු, මහරහතන් වහන්සේලාට, දුගී මගී අසරණ අනාථාදීන්ට, තිරිසන් සතුන්ට හා ලෝකවාසී අනන්ත සත්වයන්ට ආහාරපාන දන්දීමේ ආනිසංසයක් හැටියටයි.

ඒ වගේම ඥාන බල දහයකුත් තථාගතයන් වහන්සේට පවතිනව. ඒ ඥාන බල දහය නම්,

ඨානා ඨාන කෞශල්‍ය ඥානය
කර්ම විපාක ඥානය
සබ්බත්ථ ගාමිණි පටිපදා ඥානය
අනෙක් ධාතු නානා ධාතු ලෝක ඥානය
නා නාධි මුක්ති කතා ඥානය
ඉන්ද්‍රිය පරෝපරිය ඥානය
ධ්‍යානාදීන්ගේ සංක්ලේශ වොදාන දන්නා ඥානය
පුබ්බේ නිවාස ඥානය
දිබ්බ චක්ඛු ඥානය
ආසවක්ඛය ඥානය

ඨානා ඨාන කෞශල්‍ය ඥානය කියන්නෙ මේ හේතුවෙන් මේ ඵලය, මේ හේතුවෙන් මේ ඵලය කියල හේතු ඵල සම්බන්ධතාවත් මේ හේතුවෙන් මේ ඵලය උපදින්නේ නැත මේ හේතුවෙන් මේ ඵලය උපදින්නේ නැත කියල මේ හේතු නොවන දේ පහදා දීමත් යන

දෙයාකාර වූ ඥානයයි. කොටින්ම කියනකොට අපි කියනවනෙ අවිද්‍යා පච්චයා සංඛාරා ආදි පටිච්චසමුප්පාදයෙන් කිවෙන්නෙ ඨාන කෞශල්‍ය ඥානය කියල. එතකොට ඒ හැර යම් යම් හේතුවකින් දැන් අපි හිතමු කොස් ඇටයකින් අඹ පැලයක් හටගන්නේ නෑ, අඹ ගෙඩියෙන් කොස් පැළයක් හටගන්නේ නෑ. මේ වාගේ යම් දෙයක් සිද්ධ නොවෙනවනම් ඒ බව දන්නා වූ ඥානයට කියනව අට්ඨාන ඥානය කියල. මේ විදියට හේතු ඵල ඥානයයි, අහේතුක අවල ඥානයයි සියල්ල දැන ගන්නා ඥානය ඨානා ඨාන කෞශල්‍ය ඥානය නම් වෙනවා.

අතීත වූද, අනාගත වූද, වර්තමාන වූද, කුසල් වූද, අකුසල් වූද සියලු කර්මයන්ගේ විපාක වාරය මැනවින් දන්නා ඥානය කර්ම විපාක ඥානය නම් වෙනවා.

ඒ වගේම සබ්බත්ථ ගාමිණි පටිපදා ඥානය කියන්නෙ නිරයට යන පාර, තිරිසන් අපායට යන පාර, ප්‍රේත අපායට යන පාර, මනුෂ්‍ය ලොවට යන පාර, දෙව් බඹ ලෝකවලට යන පාර, කියල පංච ගතියක් තියෙනව. මේවට සම්බන්ධව සත්වයන් ගමන් කරන හැටි උන්වහන්සේ දන්නව ඒකට කියනව සබ්බත්ථ ගාමිණි පටිපදා ඥානය කියල.

ඒ වගේම අනේකධාතු නානා ධාතු ලෝක ඥානය කියන්නෙ මේ ලෝකයේ ධාතු සියල්ලම ධාතු කොට්ඨාශ රාශියකට බෙදන්න පුළුවන්වන, ඒ සියලුම අටලොස් මහා ධාතුන් ඇතුලු කොට්ඨාශ බෙද බෙදා දක්නා ඥානයට කියනව අනේක ධාතු නානා ධාතු ලෝක ඥානය කියල.

ඒ වගේම සත්තානං නානාධිමුක්ති කතා ඥානය කියන්නෙ මේ ලෝක සත්වයා කොටස් දෙකකට උන්වහන්සේ බෙදාගෙන තියෙනව. හීනාධිමුක්තික සහ පණීතාධිමුක්තික කියල. හීන අදහස් ඇත්තෝ සහ ප්‍රණිත අදහස් ඇත්තෝ ලෙසින්. ඒ විදියට මේ කොටස්වලින් සත්වයන් බෙදා දක්නා ඥානයට කියනව නානධිමුක්ති කතා ඥානය කියල.



ඊළඟට ඉන්ද්‍රිය පරෝපරිය ඥානය කියන්නෙ මාර්ගඵල නිවන් ලබන්න සුදුසු අයගෙ සන්තානයෙහි ශ්‍රද්ධා ඉන්ද්‍රිය, විරිය ඉන්ද්‍රිය, සති ඉන්ද්‍රිය, සමාධි ඉන්ද්‍රිය, ප්‍රඥා ඉන්ද්‍රිය කියන ඉන්ද්‍රිය ධර්මයන් යම් පමණක්ද දියුනු වෙලා තියෙන්නෙ ඒ දියුණු වෙලා තිබුනු පමණ මැනගන්නා ඥානයටයි. ඒ වගේම ඒක බුදුරජානන් වහන්සේ කෙනෙකුට පමණයි ලැබෙන්නෙ වෙන කාටවත් ලැබෙන්නෙ නෑ.

ඊළඟට තියෙනව ධ්‍යාන සමාධි සමාපත්ති අභිභායතන විමොක්ඛ ආදීන්ගේ සංක්ලේශ, වොදාන, උට්ඨාව කියන අවස්ථා තුන දක්නා ඥානය. ඒ කියන්නෙ සමථ භාවනාවෙන් ධ්‍යාන ලැබෙන හැටි, ධ්‍යාන පිරිහෙන හැටි, ධ්‍යානයන්ට සංක්ලේශ වෙන හැටි, කිලුටු වෙන හැටි, ඒවායින් අභිඥා ලබන හැටි, ඒවායින් විමෝක්ෂයට පත්වෙන හැටි, මාර්ගඵල නිවන් ලැබෙන හැටි සියල්ලම දැක ගන්නා ඥානයට කියනව ධ්‍යාන සමාධි සමාපත්ති ඥානය කියල.

ඊළඟට කියනව පුබ්බේ නිවාස ඥානය. අතීත භව සංසාරේ භවයෙන් භවයට භවයෙන් භවයට ඒ ඒ ආත්ම භාව වලදීම ස්කන්ධ පරම්පරාව අනුපිළිවෙළින් පැමිණි හැටි දක්නා ඥාණයට කියනව අසවල් භාවයේ අසවල් නමින් හිටිය අසවල් ගෝත්‍රයේ අසවල් නමින් හිටිය මෙච්චර උස මහත තිබුණ මෙච්චර වර්ණවන්තයි මෙච්චර කළු පාටයි සුදු පාටයි ආදී වශයෙනුත් මේ විදියේ කෑම බීම ඇතුව ජීවත් වුනා මේ මේ විදියේ කුසල් අකුසල් රැස්කර ගත්තා ආදී වශයෙන් හැම ආත්ම භවයක් පිළිබඳවම සියල්ල දන්නා ඥානය පුබ්බේනිවාස ඥානයයි.

ඒ වගේම දිබ්බ චක්ඛු ඥානය. මුලිනුත් කියවුණා මනුෂ්‍ය ඇස ඉක්මවා පැවති දිවැස් නුවණ හා සමාන දිබ්බ චක්ඛු ඇස හා සමාන අභිඥාවක් තමයි දිබ්බ චක්ඛු ඥානය කියන්නෙ ඒකට අතීත දින 7ක් අනාගත දින 7ක් දකින්නත් පුළුවන්. අර වගේ මැරෙන උපදින සත්වයන් සුගති දුගති යන සත්වයන්, සෝභන අසෝභන සත්වයන්,

කුසල් අකුසල් කරන සත්වයන්, සම්මා දෘෂ්ඨික සත්වයන්, මිථ්‍යා දෘෂ්ඨික සත්වයන් හා හිත නැති වස්තු සියල්ලත් මේ දිබ්බ චක්ඛු ඥානයෙන් දැක ගන්නව.

ඊළඟට ආසවක්ඛ්‍ය ඥානය කියල කියන්නෙ විදර්ශනා භාවනාවෙන් හිත දියුනු කරගෙන, සප්ත විශුද්ධියෙන් හිත දියුණු කරගෙන, සෝවාන්, සකෘදාගාමී, අනාගාමී, අරහත්ත කියන මාර්ගඵල අනුක්‍රමයෙන් ගිහින් අරිහත් මාර්ගඵලයට පත්වෙන අවස්ථාවේ ප්‍රඥාවටයි. මේ ආසවක්ඛ්‍ය ඥානය දහ වැන්නයි.

මේ කියන දස වැදෑරුම් කාය බලය හා ඥාන බලය මේ සුනක්ඛත්ත ලිච්ඡවි පුත්‍රයා නොදන්නා බැවින් තථාගතයන් වහන්සේට මේ විදිහේ දෝශාරෝපණය කරන වචනය අත් නොහැර හිටියොත් ඒ වාගේම හිතන සිතිවිල්ල අත් නොහැර හිටියොත් මේ විදියේ වැරදි දෘෂ්ටිය අත් නොහැර හිටියොත්, හරියට අරිහත් මාර්ග සම්ප්‍රයුක්ත සීල, සමාධි, ප්‍රඥා ගුණයෙන් යුක්ත වූ ආර්යයන් වහන්සේ ඊළඟට අරිහත් ඵලයට පත්වන්නේ යම්සේද ඒ වාගේ හිසේ තිබුණු බරක් බහා තබන්නේ යම්සේද ඒ වගේම චුති චිත්තයට අනතුරුව අවිචීමහා නරකාදියේ උත්පත්තිය ලබනව කියල මෙහෙම දේශනා කලහ.

ඊළඟට තථාගතයන් වහන්සේ පහදා දෙනව සාරිපුත්‍රය! තථාගතයන් වහන්සේට විශාරද ඥාන හතරක් තියෙනව. මොකක්ද මේ විශාරද ඥාන හතරක් කියන්නෙ, තථාගතයන් වහන්සේ සියල්ල දන්නා වූ සර්වඥතාක් ඥානයෙන් යුක්තයි. උන් වහන්සේ සර්වඥතාක් ඥානයෙන් යුක්ත වූ නමුත් මෙන්න මේ දේ අවබෝධ කරල නෑ කියල කියන්නට ශ්‍රමණයෙක් බ්‍රාහ්මණයෙක් දෙවියෙක් මාරයෙක් කිසිවෙක් සමර්ථ වන්නේ නෑ. ඒ ගැන තථාගතයන් වහන්සේ විශාරදයි. නිර්භයයි. ක්ශේම භාවයට පත්ව ධර්මය දේශනා කරනව.

දෙවෙනි කාරණය තථාගතයන් වහන්සේ වාසනා සහිත සකල ක්ලේශයන් කෙරෙන් දුරුවූ බැවින් ආශ්‍රවක්ෂය ඥානය ප්‍රතිඥා කරනව. නමුත් තථාගතයන් වහන්සේ මේ මේ ආශ්‍රවයන් ක්ෂය කරල



නෑ කියල කියන්න ශ්‍රමණයෙක් බ්‍රාහ්මණයෙක් දෙවියෙක් මාරයෙක් බ්‍රහ්මයෙක් සමර්ථ වන්නේ නෑ. එසේ හේතු කරුණු සහිතව තථාගතයන් වහන්සේට දෝශාරෝපණය කරන්න කෙනෙක් නැති බැවින් ආශ්‍රවක්ෂය කර ඥානය ගැනත් තථාගතයන් වහන්සේ විශාරදයි. නිර්භයයි, ක්ශේම භාවයට පැමිණ ධර්මය දේශනා කරනව.

තුන්වෙනි කාරණය තථාගතයන් වහන්සේ දේශනා කරල තියෙනව අන්තරායකර ධර්ම පහක්

- කර්මාන්තරාය
- විපාකාන්තරාය
- ක්ලේශාන්තරාය
- උපවාද අන්තරාය
- ආණාවිතික්ක්‍රමණ අන්තරාය

කර්මාන්තරාය කියන්නෙ පංචාන්තරිය කර්මය. පංචාන්තරිය කර්මය කලා නං ඒකාන්තයෙන්ම අවීචියට යනව. ඒ වගේම දිව්‍ය ලෝකෙට යන ගමන වරදිනව. නිවන් දකින්න කිසිසේත් ලැබෙන්නෙ නෑ. ඒ වගේම ක්ලේශාන්තරාය කියන්නෙ නියත මිථ්‍යා දෘශ්ඨිය. මිථ්‍යා දෘෂ්ඨි ලාභී කෙනෙක් ඒකාන්තයෙන්ම අවීචියට යනව. ඔහුට දිව්‍ය ලෝකෙ යන්නවත් නිවන් දකින්නවත් ලැබෙන්නෙ නැති නිසා ඒක අන්තරායකර ධර්මයක්.

විපාකාන්තරාය කියන්නෙ අහේතුක උත්පත්තියක්, ද්විහේතුක උත්පත්තියක් ලබාගෙන සිටීමයි. අහේතුක, ද්විහේතුක උත්පත්තිලාභී තැනැත්තාට උපතින් ප්‍රඥාව නැති නිසා ඒ ජීවිතයේ ධ්‍යාන වැඩෙන්නෙ නෑ. මාර්ගඵල ලැබෙන්නෙ නෑ. නමුත් ඔහුට දානාදී කුසල් කරල දෙව්ලොවට යන්න පුලුවන්. ඒ නිසා නිවනට අන්තරාය බැවින් ඒක අන්තරායකර ධර්මයක්.

උපවාද අන්තරාය කියන්නෙ ආර්යයන් වහන්සේලාට සෝවාන් ආදි ආර්යයන් වහන්සේලාට රහතන් වහන්සේලාට පසේ බුදුවරයන් වහන්සේලාට ලොව්තුරු බුදුවරයන් වහන්සේට අපවාද දැක්වීමයි.

දෝශාරෝපණය කිරීමයි. එසේ දෝෂාරෝපණය කළොත් ඔහුට සුගති මාර්ගයත් වලකිනව. නිවන් මග වලකිනව. ඒ නිසා ඒක අන්තරායක ධර්මයක්. යම් හෙයකින් ඒ උතුමන් වහන්සේලා සමා කරගන්නවනම් එයින් බාධාවක් නැතිව යන්නට පුළුවන්.

ඒ වගේම ආණාවිතික්ක්‍රමණ අන්තරාය කියන්නේ තමා සතුව සමාදන් වූ ශික්ෂාපද දැන දැන කඩ කිරීම. බුද්ධ ආඥාව කඩ කිරීමක් ඒක ඉක්මවා යෑමක්, ඔහුට කිසිසේත්ම සුගතියට යෑමට වෙන්නෙ නෑ. ඒ වගේම නිවන් ගමන බාධා වෙනව. ඒක නිසා ඒක අන්තරායක ධර්මයක්. එහෙත් ඔහුට ඒ ආණාවිතික්ක්‍රමණ කියන ශික්ෂාපද කැඩීම ප්‍රතිඥා කරල නැවත ආයති සංවරයෙහි පිහිටියොත් පුළුවන් වෙනව සුගතියට නිවනට යන්න.

යම් කෙනෙක් කියනව, තථාගතයන් වහන්සේ දෙසූ මේ අන්තරායක ධර්මයන් අන්තරා වෙන්නෙ නෑ කියල, එසේ කියන්න ශ්‍රමණයෙක් දෙවියෙක් මාරයෙක් බ්‍රහ්මයෙක් කිසි කෙනෙක් සමර්ථ වෙන්නෙ නෑ. ඒ ගැන තථාගතයන් වහන්සේ විශාරදයි. ඒ වගේම ක්ෂේම භාවයට පත්වී නිර්භයව ධර්මය දේශනා කරනව.

හතරවෙනි කාරණය තමයි නෛර්යානික ධර්මය. තථාගතයන් වහන්සේ යම් කෙනෙක් උදෙසා ධර්මය දේශනා කරනවනං ඒ ධර්මය ශ්‍රවණය කළ තැනැත්තා එයට අනුව පිලිපැද්දොත් ඒකාන්තයෙන් මගඵල නිවන් සුව ලබනවා කියන එක තථාගතයන් වහන්සෙගේ ධර්ම නියාමයක් කියනව. යම් කිසි කෙනෙක් කියනවනං තථාගතයන් වහන්සේ දෙසූ ධර්මය නිරර්ථකයි, අවබෝධ කරගන්න අමාරුයි නැත්නම් අවබෝධ වෙන්නෙ නෑ කියල ඒක නිශ්ඵල දේශනාවක් කියල ශ්‍රමණයෙක් බ්‍රාහ්මණයෙක් දෙවියෙක් මාරයෙක් බ්‍රහ්මයෙක් කරුනු කියා දෙන්න සමර්ථ වෙන්නෙ නෑ. ඒ සඳහා තථාගතයන් වහන්සේ විශාරදයි, නිර්භයයි, ක්ෂේම භාවයට පත්වී අනුත්තරව ධර්ම දේශනා පවත්වනව. සාරිපුත්‍රය! මේ විදියට තථාගතයන් වහන්සේ විශාරද ඥාන හතරකින් සමන්නාගතයි.



බුද්ධත්වය ගැන, ආශ්‍රවක්ෂයකරත්වය ගැන, අන්තරායක ධර්මයන් ගැන, ඒ වගේම නෛර්යානික ධර්මය ගැන විශාරද බැවින් ඒ තථාගතයන් වහන්සේ චතුර් වෛශාරද්‍ය ඥානයෙන් සමන්නාගතයි. එහෙම සිටින්නා වූ තථාගතයන් වහන්සේ උදෙසා යම් කෙනෙක් මෙහෙම කියනවා. තථාගතයන් වහන්සේට උත්තරීය මනුෂය ධර්ම නෑ. තථාගතයන් වහන්සේ තර්ක විතර්ක කරමින් තමන්ට වැටහෙන වැටහෙන හැටියට බණ කියනව. හැබැයි ඒ බණ ඇසූ අයට මග ඵල නිවන් සුව ලැබෙනව කියල කියනවනං ඒ වචනය අත් නොහැර ඒ සිත අත් නොහැර ඒ දෘෂ්ඨිය අත්නොහැර හිටියොත් ඔහු අරිහත් මාර්ග ඥාන සම්ප්‍රයුක්ත සීල සමාධි ප්‍රඥාවෙන් යුක්ත ආර්යයන් වහන්සේ අරිහත් ඵලයට පත් වෙනවා සේම ඒකාන්තයෙන්ම ඒ තැනැත්තා අන්තිමේ චුතියට අනතුරුවම අවීචිමහා නරකාදියේ උත්පත්තිය ලබනවා කියන එක පහදා දුන්හ.

ඊළඟට දේශනා කොට වදාළේ තථාගතයන් වහන්සේ මේ ලෝකයෙහි උත්පත්ති ක්‍රම හතරම දන්නව. අණ්ඩජ, සංසේධජ, ඕපපාතික ඒ වගේම ජලාබුජ කියන මේ සතර ආකාරම යෝනි උන්වහන්සේ දන්නව.

අණ්ඩජ කියන්නෙ බිජුවටින් උපදින සත්වයන් ගැන සියල්ල දන්නව. ජලාබුජ කියන්නෙ මවු කුසින් බිහිවෙලා ක්ෂිරපායී සත්වයන්ගෙ තත්වය මැනවින් දන්නව. ඒ වගේම සංසේධජ කියන්නේ තෙතමන ඇති තැන්වල උපදින සත්වයන්ගේ තත්වය දන්නව. ඒ වගේම ඕපපාතික කියන දෙවියන් බ්‍රහ්මයන් ඒ වගේම නරකාදී සතුන් ආදී ප්‍රේත සතුන් ඇතැම් වෛමානික අසුරයන් ආදීන් ඕපපාතිකව උපදින හැටි උන්වහන්සේ සියල්ල දන්නව. මේ ලෝකෙ උප්පත්ති ක්‍රම වශයෙන් ඔය සතර ආකාර යෝනි බුදුරජාණන් වහන්සේ සර්ව ආකාරයෙන් දන්නව. එසේ දන්නා වූ තථාගතයන් වහන්සේ උත්තරී මනුෂ්‍ය ධර්මයන් නැතැයි කියා ඒ වගේම තර්ක විතර්ක කරමින් තමන්ට වැටහෙන හැටියට දහම් දෙසනව. හැබැයි ඒක අසන්නවුන්ට මග ඵල නිවන් ගෙන දෙනව පමණයි කියල කියනවනං ඒ තථාගතයන්

වහන්සේ උදෙසා කියන වචනය අත් නොහැර, සිත අත් නොහැර, ඒ දෘෂ්ඨිය අත් නොහැර හිටියොත් ඒකාන්තයෙන්ම අරිහත් මාර්ග සම්ප්‍රයුක්ත කෙනෙක් අරිහත් ඵලයට ඊළඟට පත්වෙන්නේ ඒකාන්තයි ඒ වගේම ඒ තැනැත්තා චුතියට අනතුරුව අපාගාමී වෙනව නරකාදියට අවීචියට යනව කියන එක ඒකාන්තයෙන් සිද්ධ වෙනව කියන එක පහදා දුන්හ.

ඒ වගේම සාරි පුත්‍රය, තථාගතයන් වහන්සේ දන්නව මේ ලෝකයෙහි පංචගතිය කියල ගමන් මාර්ග පහක් තියෙන හැටි. තථාගතයන් වහන්සේ තමන් වහන්සේගේ නුවණින් දකිනව මෙන්න මේ පුද්ගලයා මවුපියන්ට අනදර කරනව, සිල්වත් ගුණවත් උතුමන්ට අනදර කරනව, ඒ වගේම අනන්තරිය කර්ම කරනව, නියත මිසදිටු ගන්නව මේ ආදී වශයෙන් බරපතල අකුසලයක් කරල අවීචිමහා නරකයට යනව, අටමහ නරකයට යනව කියන එක උන්වහන්සෙගේ නුවණට දැනෙනව. ඒ කියන්නෙ නරකාදී තියෙනවනෙ ඔක්කොම 136 ක් එයින් එක සක්වලක තියෙන නරකාදී 136 අතුරෙන් මහා නරක අටක් තියෙනව. සංජීව, කාලසූත්‍ර, සංඝාත, රවුරව, මහා රවුරව, තාප, ප්‍රතාප සහ අවීචි කියල. ඒ අට මහා නරකයන් හතර වටේ හතර හතර බැගින් එක එක අට මහා නරකයකට දහසය බැගින් ඔසු පත් නරක තියෙනව සියල්ල ඔසු පත් නරක 128 ක්. අට මහා නරකත් එක්ක 136 ක් තියෙනව. මේ මේ පුද්ගලයා අසවල් අසවල් නරකාදියට යනව කියල උන්වහන්සේ ගමන් මග දන්නව.නිරයගාමී මාර්ගයේ මේ පුද්ගලයා මේ මේ අකුසල් කරනව. මේ තැනැත්තා ප්‍රේත ලෝකයට යනව කියන එක උන්වහන්සේගේ නුවණට පෙනෙනව. මේ තැනැත්තා මේ මේ අකුසල් කරනව මේ තැනැත්තා තිරිසන් භවේ උත්පත්තියට යනව කියන එක උන්වහන්සේ දන්නව නුවණින්.

මේ තැනැත්තා මේ මේ කුසල් කරනව මේ තැනැත්තා මීළඟට මනුලොව උපදිනව කියල මනුස්ස ලෝකෙට යන ගමන් මගත් දන්නව මේ තැනැත්තා මේ මේ කාමාවචර කුසල් කරනව මේ තැනැත්තා මේ මේ ධ්‍යාන වඩනව මේ තැනැත්තා ආයුෂය කෙළවර අසවල් දෙව්ලොව



උපදිනව අසවල් බඹතලේ උපදිනව කියල සුගතිගාමී මාර්ගයත් තථාගතයන් වහන්සේ දන්නව.

මේ විදියට මේ ලෝකයෙහි සත්වයන් මේ ලෝක සන්තානය ඇතුළත හැසිරෙන සත්වයන් පිළිබඳව පංචගතිය තථාගතයන් වහන්සේ සර්වප්‍රකාරයෙන් දන්නවා. මෙසේ දන්නා වූ තථාගතයන් වහන්සේට උත්තරී මනුෂ්‍ය ධර්මයන් නැතැයි කියල තර්ක විතර්ක කරමින් දහම් දෙසනව කියල තමන්ගේ වැටහීමට අනුව දහම් දෙසනව එසේ නමුත් එය අසන්නවුන්ට මගඵල නිවන පිණිස හේතු වෙනව කියල කිව්වොත් හරියට අරිහත් මාර්ග ඥානය පිහිටි කෙනෙකු අරිහත් ඵලයට පත් වෙනව කියන එක ඒකාන්ත සිද්ධියක් මෙන්ම හිසේ තිබූ බරක් බිම තබන්නාක් මෙන් මේ වචනය අත් නොහැර මේ සිත අත් නොහැර මේ දෘෂ්ඨිය අත් නොහැර හිටියොත් ඒකාන්තයෙන්ම අවීචිමහා නරකයේ උපදිනව කියල දේශනා කළා.

ඊළඟට පහදා දුන්න සාරිපුත්‍රය! ලෝකයේ ඉන්නව පිරිස් අටක්. මේ අට පිරිසේ තථාගතයන් වහන්සේ සිංහ ස්වරයෙන් ධර්ම දේශනා කරනව. අභීතව දේශනා කරනව. කවුද මේ අට පිරිස කියන්නෙ. ක්ෂත්‍රිය පිරිස, බ්‍රාහ්මණ පිරිස, ගෘහපති පිරිස, ශ්‍රමණ පිරිස, මනුලොව පිරිස් හතරයි. ඒ වගේම චාතුර් මහා රාජික දෙව් පිරිස, තාවතිංස දෙව් පිරිස, මාර පිරිස, බ්‍රහ්ම පිරිස කියල දෙව් ලොව බඹ ලොව පිරිස් හතරයි. මේ සියලුම අට පිරිස වෙත තථාගතයන් වහන්සේ වරින් වර වැඩම කරල සිය දහස් ගණන්, ලක්ෂ ගණන්, අසංඛ්‍ය ගණන් ඒ ඒ පිරිස් මැද්දේ තථාගතයන් වහන්සේ ධර්ම දේශනා කරනව. සමහරවිට දස දහසක් සක්වලට වඩිනව. දසදහසක් සක්වලට වැඩියහම ඒ බුද්ධ විලාසයෙන් නෙමෙයි ඒ ඇත්තන්ට පෙනෙන්නෙ. ඒ ඇත්තන්ගෙ රජ කෙනකු හැටියටයි පේන්නෙ. ඒ ඇත්තන් ඉදිරියෙ තථාගතයන් වහන්සේ ධර්ම දේශනා කරන කොට අපේ නායකයන් වහන්සේ අද විශේෂ දේශනාවක් විශේෂ අවවාදයක් අපට දුන්න නේද කියල පුදුම ප්‍රසාදයකට පත් වෙනව.

මෙසේ දස දහසක් සක්වලට පවා තථාගතයන් වහන්සේ

වැඩම කරල දහම් දෙසන්නෙ නිකන් නෙමෙයි. ගෞතම බුද්ධ ශාසනයෙහි නිවන් පතාගෙන පාරමී පිරුව අය යම් හෙයකින් ඒ ඒ ලෝකයක හිටියනං ඒ අයට තථාගතයන් වහන්සෙගේ දේශනාව අහෙන කොට පූර්ව සංඥාව මතුවෙනව. ඒ පූර්ව සංඥාව මතුවීමෙන් මේ ජම්බුද්වීපයේ උපදිනව, මනුෂ්‍ය ලෝකයේ සමහරවිට මේ මොග්ගල සක්වල, මගුල් සක්වල, දෙව්ලොව, බඹ ලෝකවල හරි උපදිනව. එහෙම අවස්ථාවේ ඔවුන්ට බුදුබණ අසා මගඵල නිවන් සුව ලබන්න සැලසෙන නිසයි තථාගතයන් වහන්සේ ඒ අන්‍ය ලෝක වලටත් වැඩම කරල ධර්ම දේශනා කරන්නෙ.

සාරිපුත්‍ර මහ රහතන් වහන්සේ අමතා වදාළා සාරිපුත්‍රය! මේ විදියට තථාගතයන් වහන්සේ අට පිරිසෙන් අභීතව සිංහ ස්වරයෙන් ධර්ම චක්‍රය පවත්වන දේශනාවල් පවත්වන අතර ඒ බව මේ සුනක්ඛත්ත ලිච්ඡවී පුත්‍රයා දන්නෙ නැතුව ක්‍රෝධයෙන් පුපුරමින් මේ තථාගතයන් වහන්සේ උදෙසා කරන මේ දෝෂාරෝපණය අත් නොහැර හිටියොත් ඒකාන්තයෙන්ම අරිහත් මාර්ගයට පත්වූ කෙනෙක් අරිහත් ඵලයට පත්වීම ඒකාන්ත මෙන්ම ඔහු ආයුෂයෙන් කෙළවර චුතියට අනතුරුව අවීචි මහා නරකයේ උත්පත්තිය ලබනව කියන එක පහදා දුන්හ.

ඊළඟට දේශනා කලා සාරිපුත්‍රය! මේ ලෝකයේ බොහෝ දෙනා හිතනව මේ තපස් රැකීමෙන් ශුද්ධියක් වෙනව කියල. නමුත් සාරිපුත්‍රය මේ තථාගතයන් වහන්සේ තරම් තපස් රැක්ක කෙනෙක් මේ ලෝකයේ ඇත්තෙ නෑ. මහා ලෝමහංස ජාතකයේ විස්තර වශයෙන් දේශනා කරනව ඒ විදියට අනන්ත ජාතිවල තථාගතයන් වහන්සේ උග්‍ර ලෙස අත්තකිලමතානු යෝගය කියන තපස් රැකීම් කරල තියෙනව. නමුත් ඒවැයින් ශුද්ධියක් ඇතිවුනේ නෑ. සමහර කෙනෙක් කියනව මේ ලෝකයේ උත්පත්තිය නිසා ශුද්ධිය ලැබෙනව කියල . සාරිපුත්‍රය මේ තථාගතයන් වහන්සේ දීර්ඝ සංසාරයේ නූපන් උත්පත්තියක් නෑ. සෑම උත්පත්තියකටම පත්වෙලා තියෙනව. නමුත් එයින් ශුද්දියක් වුණේ නෑ

සමහර කෙනෙක් කියනව ආහාරයෙන් ශුද්ධියක් ඇති වෙනව කියල .



නමුත් තථාගතයන් වහන්සේ තරම් ආහාර ජාති අනුභව කළ කෙනෙක් නෑ වෙන. උන්වහන්සේ ඒ සංසාරෙදි හැම ආහාරයක්ම අනුභව කරල තියෙනව. නමුත් ඒක ශුද්ධියක් නෙවෙයි.

ඒවගේම සමහර කෙනෙක් එක එක ශුද්ධීන් ප්‍රකාශ කල නමුත් ඒවා නියම විශුද්ධීය නෙවෙයි. තථාගතයන් වහන්සේ සොයා ගත්ත විශුද්ධිය තමයි ආර්ය අෂ්ඨාංගික මාර්ගය අංග සම්පූර්ණ කරල සතර මාර්ගඵල අනුක්‍රමයෙන් අග්‍ර නිර්වාණ ධාතුව සාක්ශාත් කර ගැනීම. මේක තමයි නියම පරම විශුද්ධිය.

ඒ වගේම සමහර කෙනෙක් කියනව සාරිපුත්‍රය, මේ වයස අවුරුදු 80, 90 වෙනකොට සිහි කල්පනාව මදියිනෙ කියල . තරුණ වයසේදි බොහෝම ධාරණ ශක්තිය ඇතුව පටිභාන ශක්තිය ඇතුව ඉදල වයසට ගියහම අරවාගේ සිහි කල්පනාව දුර්වලයි කියල සමහරු කියනව. නමුත් සාරිපුත්‍රය තථාගතයන් වහන්සේට එහෙම නෑ. යම් වෙලාවක තථාගතයන් වහන්සේ උත්පත්තිය ලැබූ සේක් නම් එදා පටන් යම් ස්මෘතියක් පැවතුනා නම් බෝධි මූලයේදී බුද්ධත්වය ලැබීමෙන් ඒක අංග සම්පූර්ණ වුණා. එදා පටන් යම් දවසක පරිනිර්වාණය සිද්ධ වෙනව නම් ඒ අතරතුර වයස ගියා කියල තථාගතයන් වහන්සෙගේ පටිභාන කුසලතාව හෝ ස්මෘතියේ හෝ අඩුවක් වන්නෙ නෑ.

සාරිපුත්‍රය! මේ තථාගතයන් වහන්සේ ළඟට සමහර විට හතර දිසාවෙන් ශ්‍රාවකයො හතර දෙනෙක් ඇවිල්ල හතර ආකාර ප්‍රශ්න අහනව. එක්කෙනෙක් අහනව කායානුපස්සනාව, එක්කෙනෙක් අහනව වේදනානුපස්සනාව, එක්කෙනක් අහනව චිත්තානුපස්සනාව, එක්කෙනක් අහනව ධම්මානුපස්සනාව. සාරිපුත්‍රය ඒ අහන අහන එක එක විදියේ සැඟවෙච්ච ගැටලුවලට පවා තථාගතයන් වහන්සේ ක්ෂණිකව පිළිතුරු දෙන්නෙ කොහොමද කියනවනං දක්ෂ දුනුවායෙක් ඊතලයක් ඉලක්ක කොට විදිනවා. ඉලක්ක කොට විදිනකොට සල් ගහක කඳ පසාරු කරගෙන යන්න නැත්නම් පහුකරගෙන යන්න යම් වෙලාවක්ද ගත වෙන්නෙ ඒ තරම් කෙටි වේලාවකදී හතර දෙනාගෙම

ප්‍රශ්න ටික විසඳල ඒ ඇත්තන්ට අවබෝධයක් ලබාදෙන්න තථාගතයන් වහන්සේ අදත් සමර්ථයි.

අද තථාගතයන් වහන්සේගේ වයස අවු 80ක් ආසන්නයි. නමුත් තථාගතයන් වහන්සෙගේ ප්‍රඥාවේ, ස්මෘතියේ බිඳක්වත් අඩුවෙලා නෑ. සාරිපුත්‍රය! මේ විදියට තථාගතයන් වහන්සෙගේ ගුණස්කන්ධය මේ ලිච්ඡවි රාජ පුත්‍රය නොදැන මේ විදියට තථාගතයින් වහන්සේගේ අගුණ ප්‍රකාශ කරමින් ක්‍රෝධයෙන් ගිලි ගිලී ඉඳල මේ වචනය අත් නොහැර සිත අත් නොහැර වාගේම මේ දෘෂ්ඨිය අත් නොහැර හිටියොත් හරියට ආර්ය මාර්ග ඥාන අතුරින් අග්‍රගන්‍යම ආර්ය මාර්ග ඥානය රහත් මාර්ග ඥානයේ පිහිටි සීලය, සමාධිය, ප්‍රඥාව පරිපූර්ණ ආර්යයන් වහන්සේ ඊළඟටම අරහත් ඵලයට පත් වෙනව ඒකාන්තයි වගේම හිසේ තිබූ බරක් බිම තබන්නාක් මෙන්ම මේ තැනැත්තා ඒකාන්තයෙන්ම අවීචීමහා නරකයේ උත්පත්තිය ලබනව කියල මේ විදියට පුදුම තේජවන්ත දේශනාවක් පැවැත්වුව.

ඒ වෙලාවෙ නාගසමාල කියන ස්වාමින් වහන්සේ පිටු පසින් පවන් සලමින් හිටියෙ. මේ නාගසමාල ස්වාමින් වහන්සේත් බොහෝ කාලයක් බුද්ධෝපස්ථාන කරපු ස්වාමින් වහන්සේ නමක්. උන් වහන්සේ පවන් සලමින් ඉන්නකොට ඉස්සරහට ඇවිල්ල වැඳල කිව්ව ස්වාමීනි මේ ධර්ම පදය අහනකොට මට පුදුමාකාර අමුත්තක් ඇති වුණා. මොකද මගේ රෝමෝද්ගමනය සිද්ධ වුණා ඒතරම් මගේ සිත පුදුම විදියට සංවේගාත්මක බවට පත්වුණා. සංවේදීතාවට පත් වුනා. අනේ ස්වාමීනි මේ ධර්ම දේශනාව මොන විදියේ ධර්ම දේශනාවක්ද ? ඒ වෙලාවේ බුදු රජාණන් වහන්සේ දේශනා කළා නාගසමාල එසේ වී නම් මේ දේශනය ගැන හිතන්න මහා ලෝමහංස ජාතක දේශනාවක් කියල, රෝමෝද්ගමනය සිද්ධ වෙන දේශනාවක් කියල ඒ නිසා මේ දේශනාව මහා සිංහනාද සූත්‍ර දේශනාවයි කියල වචන දෙකකින් හැඳින්වෙනව.

මේ දේශනාව තුලින් අපට ගන්නට තියෙනවා ඉතා වැදගත්



තේරුම් රාශියක්, අවබෝධ රාශියක්, ඒ වගේම සත්‍ය ක්‍රියා රාශියක්. බුදු රජාණන් වහන්සේගේ බුද්ධ සන්තානයේ තියෙන විද්‍යාමාන ගුණස්කන්ධ අතුරින් රාශියක්ම බුදුරජාණන් වහන්සෙගේ ශ්‍රී මුඛයෙන් මෙතන ඉදිරිපත් කරල තියෙනව.

පළමුවෙන්ම ප්‍රකාශ වුණා නව මහා ගුණය. මේ නව මහා ගුණය පුදුමාකාර සත්‍ය ක්‍රියා බලයක් ඇති ගුණ නවයක්.

ඊළඟට සඳහන් වුනා දිබ්බචක්ඛු ඥානය. ඒ වගේම සෘධි විධ ඥානය, දිබ්බ සෝත ඥානය, ඔය තුනම ප්‍රකාශ වුණා. මේවා අපිට සත්‍ය ක්‍රියා කරන්න තරම් බලගතු ඥාන තුනක්.

ඊළඟට සඳහන් කොට වදාළා දසබල ඥානය. මේ දසබල ඥානය පුදුම බලගතු ඥාන දහයක්. ඒ වගේම සඳහන් වුණා මෙතන විශාරද ඥාන හතරක්, චතු විශාරද ඥාන, ඒ වගේම මෙහි සඳහන් වෙනව චතු යෝනි දන්නා ඥානය, ඊළඟට පංච ගති දන්නා ඥානය, ඊළඟට මේ ශුද්ධිය ඇති වෙන ආකාර නිධානය. මේ සියල්ලම එකක් එකක් ගානෙ හිතනකොට ඕනම කෙනෙකුගේ හිතට පුදුමාකාර ශ්‍රද්ධාවක් භක්තියක් ගෞරවයක් ප්‍රසාදයක් උතුරා ඉතිරී පැතිරී පහළ වෙනව නියතයි.

පසුගිය කාලයේ අපගේ පූජනීය ආචාර්ය වරයන් වහන්සේ දැඩි සේ ගිලන් වුනා. 1975 වර්ෂයේ වස්සාන කාලයේ වෛද්‍යවරු බොහෝම පුදුමයට පත්වුණා කොහොමද මේ රෝගය තෝර ගන්නෙ කියල . සමහර විශේෂඥ වෛද්‍යවරු කියල තියෙනව මේකට බොහේම දීර්ඝ කාලයක් මේ මේ ප්‍රතිකාර කරල බලන්න ඕන කියල තේරුම් ගන්න බැරුව. ඒ අතර අපේ වැඩිහිටි ගරු ස්වාමින් වහන්සේ නමක් එවකට අපි සමීපචාරී ශිෂ්‍යයන් බැවින් අපට උපදෙස් දුන්න පණ්ඩිත ස්ථවිරයන් වහන්සේට බුදු ගුණ අලලා පිරිත් දේශනාවක් කරන්න කියල . ඉතිං අපි බුදු ගුණ සම්බන්ධව පිරිතක් සම්බන්ධ කරගෙන දේශනා කළා. වෛද්‍යවරුන් තෝරා ගන්න බැරිව තිබුණ සුව කරන්න බැරිව තිබුණ රෝගය දවසින් දවස මේ පිරිත කියා අවසන්

වන විට උන් වහන්සේට සුවපත් භාවයක් ලැබෙන මට්ටමක් ලැබුණා. නමුත් අපි මාසයක් තිස්සේ පිරිත සජ්ජායනා කළා. ඒක අදත් තියෙනව බුදු ගුණ පිරිත කියල. ඒ වගේම මේ දසබල ඥාන ආදී වූ සියලුම බුද්ධ ඥානවල ගුණ එකින් එකට අපිට මතුකරගෙන බුදු රජාණන් වහන්සෙගේ සන්තානයේ පවත්නා මේ උත්තරීතර ගුණයන් අරමුණු කරගනිමින් තම තමාටත් සෙත් පතා ගන්න පුළුවන්. ලෝ වැසියන්ටත් සෙත් පතමින් ආශිර්වාද කරන්න පුලුවන්.

දැන් මේ උදාපත් වී තිබෙන්නේ අභිනව වර්ෂයක්. මේ වර්ෂය තුළ බොහෝ දෙනා මේ සම්බුද්ධත්වය ජයන්තිය නිමිත්තෙන් නා නා ප්‍රකාර විශේෂ වැඩසටහන් සංවිධානය කරනව. ඇත්ත වශයෙන් ඒ සියල්ලම අවශ්‍යයි. ඒ එක්කම මෙන්න මේ බුදුගුණ සම්බන්ධ සත්‍ය ක්‍රියාවක් ඇති කරගෙන රටවැසි බෞද්ධ ජනතාව මේවා කරමින් ඒ ලංකාව නැවත අවුරුදු 5000 ක් යනතුරු කවදාකවත් යුද බියක් ඇති නොවෙන්න, සුළි සුලං බියක් ඇති නොවෙන්න, සුනාමි බියක් ඇති නොවෙන්න, අධි වර්ෂාවෙන් බියක් ඇති නොවෙන්න, දුර්භික්ෂ බියක් ඇති නොවෙන්න, නා නා ප්‍රකාර විපත්තීන්ගෙන් රට විනාශ නොවනු පිණිස, ආරක්ෂාව පිණිස මහජනතාව සුඛිත මුදිත වීම පිණීස ඒ වගේම ශ්‍රී ලංකාව ස්වයංපෝෂිත සමෘද්ධි ලංකාවක් වනු පිණීස සත්‍ය ක්‍රියාකරමින් බුදු ගුණ බලය අපට පිහිට කරගන්නට මේ වගේ දේශනාවක් අපි උපකාර කරගන්න එක වටිනව. ඒක ඥාන සම්ප්‍රයුක්ත පිළිවෙතක් වෙනව.

ඒ වගේම මේ බුදු ගුණ පිරිත් පමණක් නෙවෙයි බුදු ගුණ ඥාන එකින් එකට අපි ආවර්ජනා කරමින් තම තමාගේ ගුණ දර්ම දියුණුවටම අදාළ සත්‍ය ක්‍රියා හදාගන්න පුලුවන්. සෑම කෙනෙකුම කැමතියි මනුලොවින් දෙව්ලොවට යන්න. දෙව් ලොවින් බඹලොවට යන්න. බඹලොවින් නිවන් මග යන්න කැමතියි. නමුත් මේවා කැමති පමණින් සිදු වන්නේ නෑ. ඒකට අවශ්‍ය පිළිවෙත් පුරන්නට ඕන. නිත්‍ය පංචශීලය පිරෙන්නට ඕන. උපෝසථ සිල් රකින්ට ඕන. මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා කියන ගුණ වඩන්නට ඕන. මවුපිය



උපස්ථාන කරන්නට ඕන. වැඩිහිටි සංග්‍රහ කරන්නට ඕන.

ඒ වගේම පංච ශීලය මැනවින් රකිමින් ධාර්මිකව ජීවනෝපායන් පවත්වන්නට ඕන. රටේ පවත්නා වූ මේ දුර්දසා අභාග්‍යවන්ත අපරාධයන් නැතිවෙන හැටියට අපි අනුගමනය කරන්නට ඕන. මේ වාගේ කරනවනං අහසේ දෙවියොත් නමස්කාර කරනව. සක්දෙව් රජ්ජුරුවො මැණික් ඔටුනු රන් ඔටුනු පැත්තකින් තියල ලංකාවට නමස්කාර කරනවා. ශ්‍රී ලංකාවෙ බෞද්ධයො මෙහෙම ස්ථිර වශයෙන් පන්සිල් රකිනව, පොහොය අටසිල් රකිනව, ඒ වගේම ධාර්මිකව ජීවත් වෙනව කියල නමස්කාර කරන බව බුද්ධ දේශනාවෙ සඳහන් වෙනවා.

ඒ නිසා දෙවියන්ගේ පවා නමස්කාර ලබමින් ඒ වගේම සදේවක ලෝකයාගේ ආශිර්වාදයට පාත්‍ර වෙමින් උදාපත් කරගන්නා ලද මේ වර්ෂය වාසනාවන්ත පුණ්‍ය වර්ෂයක්, ධර්ම වර්ෂයක්, පාරමී වර්ෂයක් බවට පමුණුවා ගන්නට සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ ගුණස්කන්දය අපි නිතර නිතර ආවර්ජනා කරමින් අපේ ජීවිතය ධර්ම ජීවිතයක්, පුණ්‍ය ජීවිතයක් , පාරමී ජීවිතයක් ඒ වගේම නිවන් මගට අවතීර්ණ වූ ජීවිතයක් බවට පමුනුවා ගැනීම සඳහා මේ පසළොස්වක පොහෝ දවසේදි අපි අධිෂ්ඨාන කරගන්නව නම් ඉතාම වාසනාවක් කියල මා මෛත්‍රියෙන් සඳහන් කරනව.

විශේෂයෙන්ම මේ දුරුතු පුර පසළොස්වක් පොහොය දවසේ ශ්‍රී ලංකාවට තථාගතයන් වහන්සේ වැඩම කරවල දෙවියන්ට දෙසූ දේශනා අපේ ත්‍රිපිටක පොත් පත්වල නැතත් ඉතිහාසයේ සඳහන්ව පවතිනව. ඒ දවසේ තවත් විශේෂ සිද්ධියක් තමයි ලංකාවට ආශිර්වාද කරල උරුවෙල් දනව්වට වැඩම කරවල දවස් 15 ක් පමණ කෙටි කාලයක් තුළ එතන වැඩ හිටියනෙ. ඊට පෙරටුව ඊලඟට උන්වහන්සේ එහිදී උරුවෙල කාශ්‍යප ආදී දහසක් තවුසන්ට ඒහි භික්ෂු භාවයෙන් පැවිද්ද දීල ගයා ශීර්ෂයේදී ආදිත්‍ය පරියාය සූත්‍රයෙන් ධර්මය දේශනා කරල ඒ සියලුම දෙනා ත්‍රිවිද්‍යා සට් අභිඥා සිව් පිලිසිඹියා ඥාන

සහිතව අරිහත්වයට පමුනුවා රජගහනුවර රජ උයනට වැඩම කරවල බිම්බිසාර මහ රජතුමා ඇතුලු එක් ලක්ෂ විසි දහසක් දෙනාට මහා නාරද කාශ්‍යප දේශනාවෙන් ධර්මය දේශනා කරල විශාල ධර්ම සේවයක් ආරම්භ කොට වදාළ රජගහ නුවරට වැමඩ කරල මාස 2ක් ඇතුලතදී බුද්ධ ශාසනයෙහි රහතන් වහන්සේලා විසි දහසකට වැඩියෙන් ඇති කොට වදාල . අන්තිමේදී සම්බුද්ධ ශාසනය මුළු ජම්බුද්වීපය පුරාම පැතිරෙන්න පටන් ගත්ත. ඒ අතර සම්මා සම්බුදු රජාණන් වහ්න්සේ අනාගතය බලා පිරිනිවන් මන්චකයේ වැඩ ඉඳගෙන සක් දෙව් රජතුමාට විධාන කලා සක් දෙවිඳුනි මගේ ඇවෑමෙන් පස්සෙ අවු 5000 ක් තිස්සේ සම්බුද්ධ ශාසනය මුල් බැසගෙන පවතිනු ලබන්නෙ ශ්‍රී ලංකාද්වීපයේ . ඒ නිසා ශ්‍රී ලංකාද්වීපයත් දීපවාසී ජනතාවත් නිරුපද්‍රිතව ආරක්ෂා කෙරේවා කියල . උන්වහන්සේ විධාන කරල තියෙනව ඒ නිසා ශ්‍රී ලංකාද්වීප වාසී ජනතාව බොහෝම වාසනාවන්තයි. ඒ නිසා බෞද්ධ අබෞද්ධ සියලුම දෙනා එක්කාසු වෙලා සම්මා සම්බුදු රජාණන් වහන්සෙගේ ශ්‍රී සද්ධර්මය ආරක්ෂා කරමින් තම තමාගේ සුගති මග නිවන් මග ආලෝකමත් කරගැනීම සඳහා විශේෂයෙන් ආශිර්වාද ලබමින් මේ වර්ෂය පුරා අධිෂ්ඨාන කෙරෙත්වා කියල මා මෛත්‍රියෙන් ආරාධනා කරනවා.

තෙරුවන් සරණයි.



## නා උයන ආරණ්‍ය සේනාසනය

ඉතාමත් නිහඬ සුන්දර පරිසරයක පිහිටා ඇති නා උයන ආරණ්‍ය සේනාසනය අතිවිශාල බිම් ප්‍රමානයක් පුරා පැතිර පවතී. භික්ෂූන් වහන්සේලා සහ උපාසක මහතුන් සඳහා නා උයන ආරණ්‍ය සේනාසනයද, භික්ෂුනීන් වහන්සේලා සහ උපාසිකාවන් සඳහා ධම්මිකාශ්‍රමයද නේවාසිකව භාවනා කටයුතු කරගැනීමට ඔබ සැමට ඉඩ පහසුවද, එහිදී ඉතාමත් නිවැරදි මාර්ගෝපදේශයද නොඅඩුව ලැබෙනු ඇත.

නා උයනේ අරියධම්ම ස්වාමීන් වහන්සේ වර්තමානයේ ආරණ්‍ය සේනාසනයේ මුලසුන හොබවයි. උන්වහන්සේ බුදුන් දෙසූ ධර්මය එලෙසින්ම ලොවට දේශනා කරමින් සාසනික වශයෙන් ඉතාමත් අනගි සේවයක් සිදුකරමින් සිටී.

මිතුරනි, දහම් පොත පතහි දැනුමද කැටුව මෙවන් ආරණ්‍ය සේනාසනයක ඇසුර ලබාගෙන අප බුදුපියානන් හෙලි කර දුන් නිවැරදි දහම් මගට අද අදම පිවිසියහොත් නියත වශයෙන් ඊලග භවයේදී හෝ ධර්ම අවබෝධය පිනිස එම ඇසුර හේතුවෙනවා නිසැකය.

අප කල්යාන මිතුරු කැල මෛත්‍රී සිතින් සෙත් පතමින් ප්‍රාර්ථනා කරන්නේ ඔබ සැමට නා උයන ආරණ්‍ය සේනාසනය වැඳ පුදාගෙන දන් පින්කම් පමනක් සිදු කිරීමෙන් නොනැවතී ආරණ්‍ය ස්වාමීන් වහන්සේලාගේ නිවැරදි මාර්ගෝපදේශයද ලබාගෙන සම්බුදු පියානන් වහන්සේ වදාළ චතුරාර්ය සත්‍ය අවබෝධ අග්‍ර අමා මහ නිවන් අවබෝධ පිණිස කටයුතු කෙරෙත්වා කියාය.

නා උයන ආරණ්‍ය සේනාසනය පිලිබඳ ඔබ සැමට අන්තර්ජාලය ඔස්සේද පිවිසිය හැකිය.
http://www.nauyana.org/

පටිගත කරනලද ධර්මදේශණා අන්තර්ජාලය ඔස්සෙ ලබාගැනීම සඳහා සම්බන්ද වන්න
nauyanainfo@gmail.com

**මුද්‍රණය: දිමුතු මුද්‍රණාලය**
**39/2, වතුරුගම පාර, මිරිස්වත්ත,**
**ගම්පහ.**
**ටෙලි: 0778829705, 0716332119**